# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 578/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 04/04/2024<br>පැය 0550 |

## මාධ්‍ය නිවේදනය

**කොකේන් සමඟ නයිජීරියන් ජාතිකයෙකු ඇතුළු සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

දකුණු අප්‍රිකාවේ සිට ඩුබායි රාජ්‍ය හරහා ගුවන් තැපැල් මගින් මෙරටට මත්ද්‍රව්‍ය පාර්සලයක් එවන ලද බවට පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය වෙත ලද තොරතුරක් මත 2024.04.02 වන දින ඔරුගොඩවත්ත ප්‍රදේශයේ පිහිටි භාණ්ඩ බෙදා හැරීමේ ආයතනයකට අදාල මත්ද්‍රව්‍ය පාර්සලය භාර ගැනීමට පැමිණි පුද්ගලයෙකු එම පාර්සලය තුල තිබූ **කොකේන් ග්‍රෑම් 210 ක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එම සැකකරුගෙන් අනාවරණය වූ තොරතුරු මත මෙම ජාවාරමට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් තවත් සැකකරුවන් දෙදෙනෙකු එදිනම නාරාහේන්පිට හා ජාවත්ත ප්‍රදේශවල දී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එක් සැකකරුවෙකු වයස අවුරුදු 38 ක් වන නයිජීරියන් ජාතිකයෙකු වන අතර, අනෙක් සැකකරු වයස අවුරුදු 30 ක් වන මාලඹේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුවන් 2024.04.03 වන දින මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර දින 07 ක රැඳවුම් නියෝග ලබා ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**